www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගුරුවරුන්ගේ වැටුප් අරගලය සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක්

**A socialist program for Sri Lankan teachers' wage struggle**

සමාජවාදී සමානතා පක්ෂය
2008 ජූනි 10

මෙහි පහත පල වන්නේ ජූනි 11 සහ 12 යන දිනයන්හි පැවැත්වීමට නියමිතව තිබූ රාජ්‍ය අංශයේ ගුරු වැටුප් උද්ඝෝෂනයට ඉදිරිදර්ශනයක් සම්පාදනය කරමින් සමාජවාදී සමානතා පක්ෂය විසින් ජූනි 10 වෙනි දින ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල කල ප්‍රකාශනයයි.තම ජීවන තත්වයන් කාබාසිනියා කිරීමටත්, වේගයෙන් ඉහල යන උහුලා ගත නොහැකි බඩු මිලටත් එරෙහිව දස දහස් සංඛ්‍යාත ගුරුවරුන් එම උද්ඝෝෂනයට සහභාගිවීමට සිටින බැව් දැනගැනීමෙන් තැති ගත් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව "ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව" යන ප්‍රෝඩාවට මුවාවී ප්‍රකෝපකාරී ලෙස එම දෙදින තුල දිවයිනේ සියලු පාසැල් වසා දැමීමට නියෝග කොට ඇත. රාජපක්ෂ ආන්ඩුව පෙන්වා ඇත්තේ ගුරුවරුන්ගේ ඉල්ලීම ඉටු කරනු වෙනුවට එම උද්ඝෝෂනය මැඩීම සඳහා ගත හැකි සෑම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරක්ම ගැනීමට ඇති සිය සූදානම යි. මෙ මගින් සසප ඉදිරිදර්ශනය තව දුරටත් සනාත කෙරී ඇති අතර එය අධ්‍යයනය කොට පුලුල් සාකච්ඡාවක් ආරම්භ කරන ලෙස සියලු ගුරුවරුන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන් හා පීඩිතයන්ගෙන් සසප ඉල්ලා සිටියි.

සියලුම කම්කරුවන්ගේ ජීවන තත්වයන් කාබාසිනියා කරමින් බඩුමිල ඉහල යන තතු තුල වැටුප් විෂමතා අහෝසි කරන ලෙස ඉල්ලමින් වෘත්තීය සමිති තුනක් විසින් බදාදා සහ බ්‍රහස්පතින්දා කැඳවුම් කර ඇති දින දෙකක ලෙඩ නිවාඩු උද්ඝෝෂනයට රාජ්‍ය අංශයේ දස දහස් ගනනක් ගුරුවරු සහභාගිවීමට නියමිතය.

දෙමල සුලුතරයට එරෙහි සිවිල් යුද්ධය යුක්තිසහගත කිරීම සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව විසින් අවුස්සන ලද වාර්ගික ආතතිය ප්‍රතික්ෂේප කරමින් සහ වාර්ගික රේඛාවන් ඉක්මවා යමින් පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ පැවැති එක් දින වර්ජනයට සිංහල, දෙමල, මුස්ලිම් ගුරුවරු දෙලක්ෂයකට වඩා සහභාගි වූහ.

එහෙත් වර්තමාන ලෙඩ නිවාඩු උද්ඝෝෂනය කැඳවුම් කර ඇති වෘත්තීය සමිති - ලංකා ගුරු සේවා සංගමය (ලංගුසේස), අධ්‍යාපන වෘත්තිකයන්ගේ සංගමය (අවෘස) සහ සමස්ථ ලංකා එක්සත් ගුරු සංගමය (සලංඑගුස) - විසින් ම සැප්තැම්බර් 13 වර්ජනය පාවා දෙනු ලැබූහ. ඊට අමතරව, දෙසැම්බර් 31 වන විට ඔවුන්ගේ ඉල්ලීම් ලබා දෙන බවට ආන්ඩුවේ වැදගැම්මකට නැති පොරොන්දුව පිලිගනිමින් මෙම වෘත්තීය සමිති පසුගිය ඔක්තෝබර් මාසයේ දී පැවැත්වීමට නියමිතව තිබූ දෙදින වර්ජනයත් අවලංගු කලහ.

වෘත්තීය සමිති විසින් ගුරුවරුන්ගේ අරගලය යලි යලිත් ප්‍රමාද කරනු ලැබීම, එයට බාධා කරනු ලැබීම සහ හරස් කපනු ලැබීමේ කාරනාව ම පසුගිය සැප්තැම්බර් මාසයේ වර්ජනය ආසන්නයේ දී සමාජවාදී සමානතා පක්ෂය විසින් නිකුත් කරන ලද අනතුරු ඇඟවීම සනාථ කරයිඃ "ආන්ඩුව ගෙනයන ප්‍රතිගාමී යුද්ධයට කරගැසිය යුත්තේ වැඩ කරන ජනතාව යයි ආන්ඩුව තරයේ කියා සිටී. ආන්ඩුවට ද එය පවත්වාගෙන යන යුද්ධයට ද විරුද්ධව දේශපාලන අරගලයක් කරන්නේ නැතිව වැටුප් හා සේවා කොන්දේසි සඳහා වූ ඉතා සීමිත ව්‍යායාමයක් පවා අසාර්ථක වීම නියත ය." යුද්ධය නතර නොකර තීව්‍ර කල යුතු යැයි දැඩිව ඉල්ලා සිටින සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ ලංගුසේස සැප්තැම්බර් 13 වර්ජනය පාවා දීම අහම්බයක් නොවේ.

ජීවන වියදම දරාගත නොහැකි මට්ටමකට ඉහල නැග ඇති කොන්දේසි යටතේ වැටුප් සඳහා අරගලයක් ඉල්ලා සිටිනු ලබන සාමාජික ගුරුවරුන්ගේ පීඩනය යටතේ තවත් අධ්‍යාපන වෘත්තීය සමිති එකොලහක් ලෙඩ නිවාඩු උද්ඝෝෂනය අනුමත කර ඇත. එහෙත්, ලෙඩ නිවාඩු උද්ඝෝෂනය කාර්මික ක්‍රියාවක් පවා නොවේ; ඒ වෙනුවට ගුරුවරුන් ඔවුන්ගේ වාර්ෂික අසනීප නිවාඩු දීමනාවෙන් දින දෙකක්

පරිත්‍යාග කල යුතුය. සරල සත්‍යය නම් වෘත්තීය සමිති නායකයන් යුද්ධයට සහ රාජපක්ෂ ආන්ඩුවට විරුද්ධවීම ප්‍රතික්ෂේප කරන නිසා වර්ජනයක් කැඳවීමට විරුද්ධව සිටීමයි.

වැටුප් ඉල්ලීමක් වෙනුවට, අධ්‍යාපන පරිපාලන සේවයේ සේවකයන් සමග සංසන්දනය කිරීමේ දී ගුරුවරුන්ට අවාසියක් නිර්මානය කල 1997 තරම් ආපස්සට යන වැටුප් විෂමතා අහෝසි කිරීමේ ඉල්ලීම වෘත්තීය සමිති විසින් පෙරට දමා තිබේ. රුපියල් 5,000 මාසික වැටුප් වැඩිවීමක් ඉල්ලා ඇති නමුදු සියලුම වැඩ කරන ජනයා එක හා සමාන දුෂ්කරතාවලට මුහුන දී සිටින විට එම ඉල්ලීම මගින් එක් කම්කරු කොටසක් තවත් කම්කරු කොටසකට එරෙහිව පිහිටුවනු ලබයි.

පසුගිය වසරේ සැප්තැම්බර් 13 වර්ජනය ආසන්න දිනක වෘත්තීය සමිති නායකයන් ජනාධිපති මහින්ද රාජපක්ෂ හමුවූ අවස්ථාවේ යුද්ධයට වියදම් කරන නිසා ආන්ඩුවට වැටුප් වැඩි කල නොහැකි යයි ඔහු ප්‍රකාශ කලේ ය. රාජපක්ෂ කෙලින්ම වෘත්තීය සමිති නායකයන්ට අභියෝග කරමින් ඔවුන්ට අවශ්‍ය යුද්ධය නතර කිරීමට දැයි ඇසූ විට එකම වෘත්තීය සමිති නායකයෙක්වත් ඊට පිලිතුරු දුන්නේ නැත.

සමිති නායකයන් සහ ජනාධිපති අතර සාකච්ඡාවෙන් සෘජුව ම එලිදරව් වුයේ කම්කරු පන්තිය බෙදීමට, අවමංගත කිරීමට සහ එහි සටන් ධාරිතාවය විනාශ කිරීමට මුදා හැර ඇති යුද්ධයට විරුද්ධවීමෙන් තොරව ගුරුවරුන් හෝ කම්කරු පන්තියේ අවශේෂ කොටස් විසින් ආරම්භ කරන අරගලයක් පෙරට ගෙන යාමට නොහැකි බවය. යුද ව්‍යායාමය විවේචනය කරන හෝ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජ අයිතීන් පිලිබඳ හඬක් නගන කවරෙකු වුව ද රාජපක්ෂ ආන්ඩුව විසින් පුරුද්දක් ලෙසම ද්‍රෝහියෙක් සහ දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) උදව් කරන්නෙක් යැයි හංවඩු ගසනු ලබයි.

මෙම කොන්දේසි යටතේ උතුරු - නැගෙනහිරින් හමුදා ආපසු කැඳවීමට කෙරෙන ඉල්ලීමෙන් තොරව කම්කරු පන්තියට අඩියක්වත් පෙරට යා නොහැකි ය. කොලඹ ආන්ඩුවට සහ එල්ටීටීඊ බෙදුම්වාදීන්ට එරෙහිව සහ යුද්ධය අවසන් කිරීමට පීඩිත මහජනතාව සමග සිංහල දෙමල කම්කරු පන්තිය එකමුතු කල හැක්කේ මේ ආකාරයට පමනි.

වෘත්තීය සමිති තුල සිටින ජවිපෙ නායකයන් විසින් මූලිකත්වය ගනු ලබන ලෙඩ නිවාඩු උද්ඝෝෂනය හෝ වෙනත් කවර උද්ඝෝෂනයක් ගැනවත් කම්කරුවන් විශ්වාස නොකල යුතු ය. 2005 නොවැම්බර් මාසයේ දී රාජපක්ෂ බලයට පත්කිරීම සඳහා ජවිපෙ ප්‍රධාන භූමිකාවක් ඉටු කල අතර ඔහුගේ කම්කරු විරෝධී සියලුම පියවරයන්ට සහයෝගය ද දුන්නේ ය. නිමක්නැති පැහැරගැනීම් සහ අතුරුදහන් කිරීම් රට පුරාම සිදුවන තතු යටතේ සෑම මාසයකම හදිසිනීතිය දීර්ඝ කිරීමේදී ආන්ඩුවට පක්ෂව ඡන්දය පාවිච්චි කල ජවිපෙ, ඉහල යන ජීවන වියදමට ඉන්ධන සපයමින් යුද්ධය සඳහා පෙර නොවූ විරූ ලෙස රුපියල් බිලියන 163ක් වෙන් කල පසුගිය අයවැය සම්මත කර ගැනීම සඳහා ද ආන්ඩුවට උදව් කලේ ය.

මෙම පිලිවෙත් නිසා ජවිපෙ සමාජ පදනම බිඳවැටී ඇති අතර එහි සාමාජිකත්වය විශාල ලෙස ඛාදනය වී ඇත. ඔවුන්ගේ පාර්ලිමේන්තු කංඩායමේ හිටපු නායක විමල් වීරවංශ නායකත්වය දුන් දස දෙනෙකුගෙන් යුත් පාර්ලිමේන්තු මන්ත්‍රී කංඩායමක් පක්ෂයෙන් කැඩී ගියහ. ජවිපෙ මෑත භේදයේ හරිමැද පැවතියේ මෙම අර්බුදයයි. ඉහල නැගෙන ජීවන වියදමට එරෙහිව උද්ඝෝෂන මෙහෙයවීමේ ජවිපෙ මවාපෑම කම්කරු පන්තිය අතර යම් විශ්වාසනීයත්වයක් යලි දිනාගැනීමේ මංමුලා සහගත උත්සාහයක් පමනි.

රාජ්‍ය සහ පුද්ගලික අංශයේ කම්කරුවන් සඳහා රුපියල් 5,000ක වැටුප් වැඩිවීමක් ඉල්ලීම මගින් ම ජවිපෙ උද්ඝෝෂනයේ ප්‍රෝඩාකාරී ස්වභාවය එලිදරව් වී ඇත. මෑත සමීක්ෂනයකට අනුව මාර්තු 31 වන දාට පස්දෙනෙකුගෙන් යුත් පවුලක් සඳහා තක්සේරුගත අවම මාසික වියදම රුපියල් 30,885කි. රාජ්‍ය අංශයේ කම්කරුවෙකුගේ වර්තමාන අවම මාසික වැටුප රුපියල් 11,370කි. ජවිපෙ ඉල්ලීම ආන්ඩුව විසින් ඉටු කරනු ලැබුවත් එමගින් ආවරනය කෙරෙන්නේ කම්කරු පන්තික පවුලකට ජීවත් වීමට අවශ්‍ය කරන මුදලින් අඩක් පමනි. එමෙන්ම මැයි මාසයේ සිට බස් ගාස්තු සියයට 27න් සහ දුම්රිය ගාස්තු සියයට 300න් ඉහල දමා ඇත. ආහාර පාන වර්ගවල මිල පසුගිය වසර පුරා සියයට 42.8කින් ඉහල නැගීමත් සමග මැයි මාසයේදී උද්ධමන රේට්ටුව සියයට 26.2 දක්වා ඉහල නැගුනි.

මෙම කොන්දේසි කම්කරුවන් ඉහල වැටුප් සඳහා අරගලවලට තල්ලු කරන නමුත් දේශපාලන සංස්ථාපිතයට සහ පුද්ගලික ලාභ පද්ධතියට මුලුමනින්ම ගැට ගැසී ඇති වෘත්තීය සමිති, සාමාජිකත්වය සමග කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවකින් තොරව හිතුවක්කාර ලෙස ඔවුන්ගේ ඉල්ලීම් කප්පාදු කරන අතර සාමාජිකත්වය දුර්මුඛ කිරීමට පමනක් තුඩු දෙන බෙලහීන විරෝධතා ක්‍රියාවන් කැඳවුම් කරති.

දුප්පතුන් සහ පොහොසතුන් අතර අගාධය පුලුල් කෙරෙමින් ව්‍යාපාරික පැලැන්තිය තර කෙරෙන සමස්ථ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයට, පුද්ගලීකරනයට සහ නිදහස් අධ්‍යාපනය ඇතුලු රාජ්‍ය සේවා අරමුදල් කප්පාදුවලට එරෙහිව කෙරෙන පුලුල් අරගලයෙන් ගුරුවරුන්ගේ වැටුප් අරගලය වෙන් කල නොහැකි ය. අධ්‍යාපනයේදී මෙම ප්‍රතිපත්ති මග පාදා ඇත්තේ පුද්ගලික පාසැල් සහ විශ්වවිද්‍යාලවල වර්ධනයට ය. යුද්ධය උත්සන්න කිරීමේ රාජපක්ෂගේ වෑයම මගින්

නිදහස් අධ්‍යාපනය ඇතුලු අනෙකුත් සමාජ වැඩපිලිවෙලවල්, බලගතු ප්‍රතිපාදන හිඟයකට පත් කර ඇතුවා පමනක් නොව, මෙම මහා ව්‍යාපාරික ක්‍රියාපිලිවෙත කෙරෙහි කම්කරු පන්තියේ වැඩෙන විරෝධය ජාතිකවාදය හා වර්ගවාදය තුල ගිල්වා දැමීමට ද මාන බලයි. ඔහුගේ පූර්වගාමීන් සියල්ලන් මෙන්ම රාජපක්ෂගේ දුබල සභාග ආන්ඩුව ද නැගෙන සමාජ නොසන්සුන්තාවයට ප්‍රතිචාර දක්වන්නේ රට යලිත් ව්‍යසනකාරී ගැටුමට ඇද දමමිනි.

ජීවන තත්වයන්ට සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව තීව්‍ර කෙරෙන ප්‍රහාරයන්ටත් යුද්ධයටත් එරෙහිව සටන්කිරීමේ දී කම්කරුවන්ට ජාත්‍යන්තර සමාජවාදය මත පදනම් වූ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍යකෙරේ. ගුරුවරුන්ගෙන් ද අවශේෂ සියලු කම්කරුවන්ගෙන් ද සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටින්නේ අල්පතරයකගේ ලාභය සඳහා නොව බහුතරයකගේ අවශ්‍යතාවන් සපුරාලන පරිදි සමාජය මුලුමනින්ම ප්‍රතිසංවිධානය කරන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා අරගලයට එක්වන ලෙසයි. සිංහල දෙමල මුස්ලිම් කම්කරු පන්තිය දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලයට ඒකාබද්ධ විය යුතු ය.

© www.wsws.org